ව්‍යාපාර අධ්‍යයනය I – 13 ශ්‍රේණිය

දෙවන වාර පරීක්ෂණය - 2019 **කාලය පැය 2**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

01) පහත දැක්වෙන්නේ ව්‍යාපාර හා සම්බන්ධ වගන්ති කිහිපයකි.

A. ලාභ උපරිම කිරීම
B. සම්පත් වලට අගය එකතු කිරීම
C. සමාජ හා ප්‍රජාවගේ සුභසාධනය
D. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම
E. වෙළෙඳපොලේ රැඳී සිටීම

ඉහත වගන්ති අතරින් ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු වන්නේ

(1) A, B හා C (2) B, D හා E (3) B හා D
(4) A හා D (5) D හා E (.........)

02) “x” තීරුවෙන් ව්‍යාපාර පරිසර සහ “Y” තීරුවෙන් විවිධ පරිසර බලවේග පහතින් දැක්වේ.

X		Y	
A	අභ්‍යන්තර පරිසරය	1	ප්‍රජාව/තාක්ෂණය/ සමාජ හා සංස්කෘතිය
B	ආසන්න පරිසරය	2	අයිතිකරුවෝ / සම්පත් / සංවිධාන ව්‍යුහය
C	සාර්ව පරිසරය	3	තාක්ෂණය / සම්පත් / පාරිභෝගිකයෝ
		4	පාරිභෝගිකයෝ / තරඟකරුවෝ / සැපයුම්කරුවෝ
		5	පාරිභෝගිකයෝ / අයිතිකරුවෝ / සම්පත්

A,B හා C පරිසර සඳහා බලපෑම් එල්ල කරන බලවේග අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 1,2, හා 3 (2) 2,4, හා 1 (3) 3,4, හා 5
(4) 1,2, හා 4 (5) 2,1 හා 3 (.........)

03) තිරසර සංවර්ධන සංකල්පය දැක්වෙන සටහනක් පහත දැක්වේ.



I, II හා III හිස්තැන් සඳහා අදාළ සංකල්ප අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දැරිය හැකි බව, ආර්ථික තිරසර සංවර්ධනය, පාරිසරික තිරසර ආරක්ෂණය
(2) දැරිය හැකි බව, පාරිසරික තිරසර ආරක්ෂණය, ආර්ථික තිරසර සංවර්ධනය
(3) තිරසර සංවර්ධනය, දැරිය හැකි බව, පාරිසරික තිරසර ආරක්ෂණය
(4) ආර්ථික තිරසර සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදී බව, පාරිසරික තිරසර ආරක්ෂණය
(5) තිරසර සංවර්ධනය, ආර්ථික තිරසර සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදී බව (.......)

04) රජයක ආර්ථික අරමුණු හා එම අරමුණු ඉටු කර දීම සඳහා ව්‍යාපාර දායක වන ආකාර කිහිපයක් පහත දැක්වේ.

A. පූර්ණ සේවා නියුක්තිය
B. ප්‍රතිපත්ති පිළිපැදීම
C. අභ්‍යන්තර මිල ස්ථායිතාව
D. දේශීය සම්පත් භාවිතය
E. සාධාරණ ආදායම් ව්‍යාප්තිය

ඉහත දෑ අතරින් රජයක ආර්ථික අරමුණු පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A, B, D (2) B, D, E (3) C, D, E
(4) A, B, C (5) A, C, E (........)

05) හවුල් ව්‍යාපාරයක් හා සම්බන්ධ අවස්ථා කිහිපයක් සහ පනත් කිහිපයක් පහත දැක්වේ.

අවස්ථා		පනත්	
1	ලියාපදිංචි කිරීම	A	1890 හවුල් ව්‍යාපාර ආඥා පනත
2	උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව	B	1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
3	ලිඛිත හවුල් ගිවිසුම	C	1840 අංක 7 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත
		D	2007 අංක 7 දරණ සමාගම් පනත

හවුල් ව්‍යාපාර හා සම්බන්ධ අවස්ථා සඳහා අදාල වන පනත අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A, B, C (2) A, C, B (3) B, D, C
(4) B, A, C (5) D, B, A (.........)

06) ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක සුවිශේෂ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. ....i............. ක අවම සාමාජික සංඛ්‍යාව දෙකක් වේ.
B. ....ii............ ක කොටස්වල අගය නොවෙනස්ව පවතී.
C. ....iii............ ට කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ හැකියාව ඇත.
D. ....iv.......... නෛතික පුද්ගලතාවයක් හිමි නොවේ.

i, ii, iii හා iv හිස්තැන් සඳහා අදාළ ව්‍යාපාර සංවිධාන වර්ග අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) සීමිත පොදු සමාගම්/ සීමිත පෞද්ගලික සමාගම්/සංස්ථාපිත සමාගම්/ ඒක පුද්ගල ව්‍යාපාර
(2) සංස්ථාපිත සමාගම් / සමුපකාර / සීමිත පෞද්ගලික සමාගම් / හවුල් ව්‍යාපාර
(3) ඇපයෙන් සීමිත සමාගම් / දෙපාර්තමේන්තු / සීමාරහිත සමාගම් / සමුපකාර
(4) ඇපයෙන් සීමිත සමාගම් / සමුපකාර / සීමිත පොදු සමාගම් / දෙපාර්තමේන්තු
(5) සීමාරහිත සමාගම් / සීමිත පොදු සමාගම් / සමුපකාර / රාජ්‍ය සංස්ථා (..........)

07) අශානි සිල්වා 'හර්බල් ප්‍රඩක්ට්ස්' නමින් දේශීය ඖෂධ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ආයතනයේ සේවය කරන නිර්මාණී පෙරේරා ඩෙංගු මර්ධනය සඳහා ඇයගේම වට්ටෝරුවකට අනුව නව ශාඛසාර ඖෂධයක් නිපදවා ඇති අතර, ආයතනය එම ඖෂධය වෙළෙඳපොළට හඳුන්වාදීමට සැලසුම්කර ඇත. මෙම සිද්ධියෙහි ඇතුලත් ව්‍යවසායකත්වය වන්නේ,

(1) ගෝලීය ව්‍යවසායකත්වයයි (2) සමාජයීය ව්‍යවසායකත්වයයි
(3) අභ්‍යන්තර ව්‍යවසායකත්වයයි (4) හරිත ව්‍යවසායකත්වයයි
(5) කාන්තා ව්‍යවසායකත්වයයි (..........)

08) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමේ දී භාවිතා කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ව්‍යාපාර ලෙස නිර්ණායකය ඉදිරිපත් කර ඇත්තේ,

(1) ශ්‍රී ලංකා මහ බැංකුව (2) කාර්මික සංවර්ධන මණ්ඩලය
(3) කාර්මික තාක්ෂණික ආයතනය (4) කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය
(5) විදුලිබල මණ්ඩලය (..........)

09) මුදල් වර්ග හඳුන්වන වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A. වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටුකරන පහසුවෙන් මුදල් බවට පත්කළ හැකි වත්කම්.

B. මූල්‍ය අධිකාරියේ නියෝගය මත නිකුත් කරයි. ද්‍රවශීලීතාව 100%.

C. වානිජ බැංකු පවත්වාගෙන යන ඉල්ලුම් තැන්පතුවල ශේෂ

A,B හා C වලින් හැඳින්වෙන මුදල් වර්ග අනුපිළිවෙලින් දැක්වෙන පිලිතුර තෝරන්න.

(1) ව්‍යවහාර මුදල් / බැංකු මුදල් / ආසන්න මුදල්

(2) ආසන්න මුදල් / බැංකු මුදල් / ව්‍යවහාර මුදල්

(3) බැංකු මුදල් / ව්‍යවහාර මුදල් / ආසන්න මුදල්

(4) ආසන්න මුදල් / ව්‍යවහාර මුදල් / බැංකු මුදල්

(5) ව්‍යවහාර මුදල් / ආසන්න මුදල් / බැංකු මුදල් (……….)

10) මූල්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. විධාන චෙක්පතක් පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය වේ.

B. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රථම අධිපතිවරයා වූයේ ජෝන් එක්ටර් ය.

C. නිර්ලේඛන සුරකුම්පත් පියවීමේ පද්ධතිය ලංකාවේ ඇති එකම විශාලම ගෙවීම් පද්ධතියයි.

D. සණස සමිති ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් මුදා හැර ඇත.

E. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් තැන්පතු භාර නොගන්නා විශේෂිත මූල්‍ය ආයතනයකි.

ඉහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) A (2) B (3) C (4) D (5) E (……….)

11) 'නේශා ගාමන්ට්ස්' නවීන නිමි ඇඳුම් අලෙවිසැලකි. මෙම ව්‍යාපාරයේ සේවකයින් එකසිය පනහකට අධික සංඛ්‍යාවක් සිටින අතර මහල් තුනකින් යුත් ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වාගෙන යයි. නේශා ගාමන්ට්ස් ආයතනයට රක්ෂණය කළ නොහැකි අවදානමක් සඳහා උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) ව්‍යාපාරික ගොඩනැගිල්ල ගින්නකින් විනාශ වීමේ අවදානම

(2) බැංකුවේ සිට ව්‍යාපාරයට මුදල් රැගෙන ඒමේ අවදානම

(3) ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් නොලැබීමේ අවදානම

(4) ජල ගැලීම් නිසා සිදුවිය හැකි අවදානම

(5) ඇඟලුම් මෝස්තර වෙනස්වීම නිසා සිදුවිය හැකි අවදානම (……….)

12) ව්‍යාපාරයක සන්නිවේදනය සිදුවන මාධ්‍ය හා එම මාධ්‍ය මගින් සන්නිවේදනය සිදුවන ආකාර සඳහා නිදසුන් පහත දැක්වේ.

සන්නිවේදන මාධ්‍ය	නිදසුන්
1. ලිඛිත, අභ්‍යන්තර, විද්‍යුත් නොවන	A. දුරකථන
	B. ඉන්ටර්කොම්
	C. හඬතැපෑල
	D. මෙමෝ පත්‍ර
2. වාචික, බාහිර, විද්‍යුත්	E. SMS සේවාව
	F.දැන්වීම් පුවරු

සන්නිවේදන මාධ්‍ය හා නිදසුන් නිවැරදිව ගැලපූ පිළිතුර තෝරන්න.

(1) 1- C, D	2 - A , E	(2) 1- E, F	2 - B , C
(3) 1- B, E	2 – C, F	(4) 1- D, F	2 - A , C
(5) 1- D, E	2 - A , B		(……….)

13) පහත දැක්වෙන්නේ විවිධ ප්‍රවාහන ක්‍රම වල වාසි කිහිපයකි.

A. රට පුරා ව්‍යාප්තව පැවතීම

B. ආරක්ෂාකාරී ප්‍රවාහන ක්‍රමයක් වීම

C. ගමනාන්තය තෙක් ගමන් කළ හැකි වීම

D. සාපේක්ෂව ගාස්තු අඩුවීම

E. විශාල තොගයක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම

ඉහත වාසි අතරින් දුම්රිය ප්‍රවාහනයේ වාසි පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) B, D, E (2) A, B, C (3) B, C, D

(1) C, D, E (5) A, B, D (……….)

14) විදේශ වෙළෙඳාමේ දී භාවිතා වන ලියවිලි අතර තීරුබදු සහන ලබා ගැනීම සඳහා වැදගත් වන ලියවිල්ල වන්නේ,

(1) නෞභාර පත්‍රය (2) ප්‍රභවස්ථාන සහතිකය (3) ණයවර ලිපිය

(4)සනීපාරක්ෂක සහතිකය (5) රක්ෂණ සහතිකය (……….)

15) ආනයන ක්‍රියාපටිපාටිය පහත ගැලීම් සටහනින් දැක්වේ.

විදේශ සැපයුම්කරුවකු තෝරා ගැනීම ⟶ ………i……………….. මිල කියුමක් ලැබීම ⟶ ……ii………
⟶ ඇණවුම ඉදිරිපත් කිරීම ⟶ ගෙවීම පිලිබඳ කටයුතු කිරීම ⟶ ……………iii…………..

ඉහත සටනේ අංක i, ii හා iii හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර අනුපිළිවෙළින් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) ඉන්ඩෙන්ටුව ඉදිරිපත් කිරීම / රක්ෂණ සහතිකය ලබා ගැනීම / මුදල් ලබා ගැනීම

(2) ආනයන බලපත්‍ර ලබා ගැනීම / මිල විමසුමක් යැවීම / භාණ්ඩ නිදහස් කර ගැනීම

(3) මිල විමසුමක් යැවීම / ආනයන බලපත්‍ර ලබා ගැනීම / භාණ්ඩ නිදහස් කර ගැනීම

(4) රක්ෂණ සහතිකය ලබා ගැනීම / ආනයන බලපත්‍ර ලබා ගැනීම / මුදල් ලබා ගැනීම

(5) මිල විමසුමක් යැවීම / අපනයන බලපත්‍ර ලබා ගැනීම / නෞභාරපත්‍රය ලබා ගැනීම (……….)

16) මනා ලෙස සැලසුම්කරණය කොට සකස් කරන ලද සැලසුමක විවිධ කරුණු අඩංගු වේ. එසේ අඩංගු කරුණු පිලිබඳ කෙටි අර්ථකතනයක් “x” තීරුවෙහි ද අඩංගු කරුණු “Y” තීරුවෙහි ද ඇතුළත් වේ.

	X අර්ථකතනය		Y කරුණු
1	සමස්ත ආයතනය සඳහා මගපෙන්වන සමස්ත කාර්යභාරය සම්පිණ්ඩනය කර දක්වන ප්‍රකාශය	A	පරමාර්ථ
2	සංවිධානයක් දිගුකාලයක දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂාවන්	B	අරමුණු
3	යම් නිශ්චිත කාර්යයක් ඉටු කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු නිශ්චිත පියවර	C	ප්‍රතිපත්ති
		D	නිෂ්ඨාව
		E	ක්‍රියාමාර්ග
		F	දැක්ම
		G	නිතීරීති

“x” තීරුවේ ඇති අර්ථ කතනය සහ “Y” තීරුවේ ඇති කරුණු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1 - D 2 - B 3 – C (2) 1 - D 2 - F 3 – G

(3) 1 - C 2 - B 3 –G (4) 1 - F 2 - C 3 - E

(5) 1 - F 2 - A 3 - E (……….)

17) සීමිත සකුරා (පෞද්) සමාගම තම සේවක සේවිකාවන් සඳහා පවත්වන ලද සුහද හමුවේ දී එම ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් පසුගිය වසරේ විවිධ දක්කම් පෙන්වූ සේවකයන් කිහිප දෙනෙකු ඇගයීමට ලක්කරමින් ඔවුන්ට ත්‍යාග ප්‍රධානයක් සිදු කරන ලදී. මෙම සිද්ධියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා කටයුතු කළ ප්‍රධාන භූමිකාව හා ඊට අයත් උපභූමිකාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අන්තර් පුද්ගල භූමිකාව – ප්‍රධානියා

(2) තොරතුරු භූමිකාව – තොරතුරු බෙදා හරින්නා

(3) තීරණ භූමිකාව – සම්පත් වෙන්කර දෙන්නා

(4) අන්තර් පුද්ගල භූමිකාව – නායකයා

(5) තීරණ භූමිකාව – ව්‍යවසායකයා (……….)

18) පාලන ක්‍රියාවලියේ පියවර පහත සටහනින් දැක්විය හැකිය.



ඉහත ක්‍රියාවලියේ I, II හා III හිස්තැන් සඳහා ගැලපෙන පිළිතුරු අනුපිළිවෙළින් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

(1) විචලන හඳුනා ගැනීම / තත්ත්ව පාලනය / කාර්යඵල මැනීම
(2) කාර්යඵල මැනීම / යන්ත්‍ර අලුත්වැඩියාව / තත්ත්ව පාලනය
(3) කාර්යඵල මැනීම / ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම / කිසිවක් කළ යුතු නැත
(4) තත්ත්ව පාලනය / කිසිවක් කළ යුතු නැත / ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම
(5) ප්‍රමිති වෙනස් කිරීම / යන්ත්‍ර අලුත්වැඩියාව / තත්ත්ව පාලනය (..........)

19) මෙහෙයුම් කළමනාකරණය හා සම්බන්ධ සංකල්ප කිහිපයක් "X" තීරුවෙහි ද "Y" තීරුවෙහි එම සංකල්ප අර්ථ දැක්වීම ද පහත සඳහන් වේ.

X	Y
1. සමච්ඡේදන ලක්ෂ්‍යය	A. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමට නිෂ්පාදිතයකට ඇති හැකියාව
2. පොරොත්තු කාලය	B. ද්‍රව්‍ය ඇණවුම් කළ අවස්ථාවේ සිට එම ද්‍රව්‍ය ගබඩාවට ලැබීම තෙක් ගතවන කාලය
3. ගුණාත්වය	C. නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක්ම විධිමත් පරීක්ෂාවකින් යුතුව සිදු කිරීමට ගනු ලබන ක්‍රියා පිළිවෙත්
4. තත්ත්ව ආරක්ෂණය	D. ලාභ හෝ අලාභ නොලබන නිෂ්පාදන හෝ අලෙවි මට්ටම

X හා Y නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

(1) 1 - D 2 - B 3 - A 4 - C
(2) 1 - B 2 - A 3 - D 4 - C
(3) 1 - C 2 - B 3 -D 4 - A
(4) 1 - A 2 - C 3 - B 4 - D
(5) 1 - B 2 - A 3 - C 4 - D (..........)

20) සීමාසහිත රන්රස බිස්කට් සමාගමේ තොග සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- එක් ඇණවුම් කිරීමක් සඳහා වැය වන පිරිවැය රු.300
- ඒකකයක පිරිවැය රු.100
- මාසික ද්‍රව්‍ය පාරිභෝජනය ඒකක 1000
- තොග රඳවා ගැනීමේ වාර්ෂික පිරිවැය ඒකකයකට රු.5

ඉහත තොරතුරු ඇසුරින් මෙම ව්‍යාපාරයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ,

(1) ඒකක 1000
(2) ඒකක 1200
(3) ඒකක 1600
(1) ඒකක 3100
(5) ඒකක 600 (..........)

21) ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාරයක් නොවන්නේ,

(1) පුහුණු සේවකයන් යොදා ගැනීම
(2) දිරිගැන්වීම් ලබා දීම
(3) මනා සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීම
(4) ඉහළ තත්ත්වයෙන් යුත් අමුද්‍රව්‍ය යොදා ගැනීම
(5) තත්ත්ව කව යොදා ගැනීම (..........)

22) අලෙවිකරණ හර සංකල්ප පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A. යම් නිෂ්පාදිතයක් පිළිබඳ පාරිභෝගිකයාගේ මනසෙහි යහපත් ආකල්පයක් ගොඩනැගීම ....i.................... ලෙස හඳුන්වයි.

B. ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම් සමූහය ....ii............. ලෙස හඳුන්වයි.

C. ඉලක්ක වෙළෙඳපොළ වෙත ළඟා වීමට අලෙවිකරුවකු යොදා ගන්නා විවිධ ප්‍රවේශ ....iii........... ලෙස හඳුන්වයි.

D. බාහිර පාර්ශවයන් ස්වෙච්ඡාවෙන් ආයතන පිළිබඳ කරුනු ලබන සන්නිවේදනය.........iv.................. ලෙස හඳුන්වයි.

ඉහත හිස්තැන් සඳහා අදාළ වන අලෙවිකරණ හර සංකල්ප කිහිපයක් පහත දැක්වේ.

1. අලෙවිකරණ මාර්ග
2. පිහිටුවීම
3. ගෙවන ලද මාධ්‍යය
4. නිරතවීම
5. උපයන ලද මාධ්‍යය
6. පිරිනැමුම

ඉහත i,ii,iii හා iv හිස්තැන් සඳහා අදාළ වන හර සංකල්පය අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 4, 1, 3, 5 (2) 2, 6, 1, 5 (3) 6, 1, 5, 3
(4) 6, 3, 5, 2 (5) 2, 3, 4, 6 (.........)

23) අලෙවිකරණ සංකල්ප කිහිපයක් "X" තීරුවේ ද එම සංකල්ප වලින් මූලික වශයෙන් අවධානය යොමුකරන ලද කරුණු "Y" තීරුවේ ද දැක්වේ.

X	Y
1. නිෂ්පාදන සංකල්පය	A. දැඩි ප්‍රවර්ධන උපක්‍රම හා භාණ්ඩ සුලබත්වය
2. නිෂ්පාදිත සංකල්පය	B. පාරිභෝගික හා සමාජයීය යහපැවැත්ම
3. විකුණුම් සංකල්පය	C. සාධාරණ මිල භාණ්ඩ සුලබත්වය
4. අලෙවිකරණ සංකල්පය	D. ඉලක්ක වෙළඳපොළ අවශ්‍යතා හා වුවමනා
	E. ඉහළ ගුණාත්මක භාණ්ඩ හා සාධාරණ මිල

X හා Y නිවැරදිව ගලපා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) 1 - C 2 - A 3 - E 4 - D (2) 1 - B 2 - D 3 - A 4 - C
(3) 1 - E 2 - C 3 -D 4 - B (4) 1 - A 2 - C 3 - B 4 - D
(5) 1 - C 2 - E 3 - A 4 - D (.........)

24) ගනුදෙනුකරුගේ දෘෂ්ඨියෙන් අලෙවිකරණ මිශ්‍රය ඉදිරිපත් කිරීමේ දී අදාල වන විචල්‍යයන් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදිතය / මිල / බෙදාහැරීම / ප්‍රවර්ධනය
(2) නිෂ්පාදිතය / ක්‍රියාවලිය / පහසුව / භෞතික වටපිටාව
(3) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා / පිරිවැය / පහසුව / සන්නිවේදනය
(4) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා / මිල / පහසුව / ප්‍රවර්ධනය
(5) මිනිසුන් / ක්‍රියාවලිය / භෞතික වටපිටාව / සන්නිවේදනය (.........)

25) මුල්‍ය කළමනාකරුවන් විසින් ගනු ලබන ප්‍රධාන තීරණ දෙක හා ඊට අදාළ නිදසුන් පහත වගුවෙන් දැක්වේ.

තීරණ	නිදසුන්
1. මූල්‍යන තීරණ	A. වෙළෙඳ ණය හිමියන් පිළිබඳ තීරණ
	B. මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ
2. ආයෝජන තීරණ	C. ලාභාංශ පිළිබඳ තීරණ
	D. බැංකු අයිරා පිළිබඳ තීරණ
	E. වෙළෙඳ තොග සම්බන්ධ තීරණ
	F. ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ

මූල්‍ය කළමනාකරණ තීරණ හා ඊට අදාළ නිදසුන් නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1 - B, E, F 2 – A, C, D (2) 1 - A, B, C 2 – D, E, F
(3) 1 - A, C, D 2 – B, E, F (4) 1 - B, D, F 2 – A, C, E
(5) 1 - D, E, F 2 – A, C, B (……….)

26) මූල්‍ය වෙළෙඳපොළට අයත් වෙළෙඳපොළවල් කිහිපයක් පහත දැක්වේ.

A. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ
B. භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
C. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
D. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
E. කොටස් වෙළෙඳපොළ

ඉහත වෙළෙඳපොළවල් අතරින් මුදල් වෙළඳපොළට අයත් වෙළඳපොළවල් පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) B, C හා D පමණි (2) A, C හා D පමණි (3) B හා C පමණි
(4) A හා D පමණි (5) ඉහත සියල්ලම (……….)

27) $$\frac{\text{බදු පසු ශුද්ධ ලාභය + පොලිය}}{\text{මුළු වත්කම්}} \times 100$$

ඉහත සූත්‍රය මගින් ගණනය කරනු ලබන්නේ

(1) ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතිකය
(2) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය
(3) ශුද්ධ ලාභ අනුපාතිකය
(4) මුළු වත්කම් පිරිවැටුම් අනුපාතිකය
(5) ජංගම අනුපාතය (……….)

28) කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරුකුම්පතක් වන සාමාන්‍ය කොටස් සම්බන්ධ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

1. මිලදී ගන්නන්ට සමාගමේ අයිතිකරුවන් විය හැකිය.
2. ස්ථිර ලාභාංශයක් හිමි නොවේ.
3. ප්‍රාග්ධනය ආපසු ගෙවන විට ප්‍රමුඛත්වය හිමි වේ.
4. පාලන බලතල හිමි වේ.
5. වාර්ෂික මහා සභා රැස්වීම් වලට සහභාගි වීමට අයිතිය ලැබේ.

ඉහත වගන්ති අතරින් සාමාන්‍ය කොටස් සම්බන්ධයෙන් එකඟ විය නොහැකි ප්‍රකාශය තෝරන්න.

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5 (……….)

29) ව්‍යාපාරයක මූල්‍ය සම්පාදන මාර්ග කිහිපයක් පහත දැක්වේ.

A. කොටස් නිකුත් කිරීම D. කල්බදු
B. බැංකු අයිරා E. රඳවාගත් ලාභ
C. බැංකු ණය F. අතිරික්ත වත්කම් විකිණීම

ඉහත මූල්‍ය සම්පාදන මාර්ග අතරින් බාහිර, දිගුකාලීන, වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) B හා C (3) C හා D
(4) D හා E (5) E හා F (……….)

30) රැකියා විස්තරයක ඇතුලත් තොරතුරක් නොවන්නේ,

(1) රාජකාරි (2) සේවා කොන්දේසි (3) සුපරීක්ෂණය
(1) වැඩකළ යුතු පැය ගණන (5) වෘත්තීය සුදුසුකම් (……….)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31) (අ) .... හා .... වල එකතුව වාණිජ්‍යය ලෙස හැඳින්වෙන අතර අන්තර්ජාලය හරහා මිල දී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීම .... ලෙස හැඳින්වේ.

(ආ) කෘෂිකාර්මික, කාර්මික හා සේවා ලෙස ව්‍යාපාර වර්ග කරන නිර්ණායකය වන්නේ ....ය.

32) (අ) ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමේ දී විවිධ කරුණු පිළිබඳ සැලකිලිමත් වේ. එහිදී චාරිත්‍ර වාරිත්‍ර, වටිනාකම්, පුරුදු හා ආකල්ප ආදිය පිළිබඳ සැලකිලිමත් වීම .... යන කරුණ සඳහා නිදසුන් වේ.

(ආ) වට්ටම් අනුපාත වෙනස් කිරීම රජයේ .... ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන උපකරණයකි.

33) (අ) ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම .... යි.

(ආ) සියලුම ශ්‍රී ලාංකිකයින් නිෂ්පාදන ආර්ථිකයක් තුළ පාර්ශවකරුවන් බවට පත්කිරීමේ අරමුණ ඇතිව රජය ආරම්භ කර ඇති වැඩසටහන වන්නේ .... ය.

34) (අ) විනිමය පාලන දෙපාර්තමේන්තුව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ .... නමිනි.

(ආ) ගනුදෙනුකරුවන්ට තනි ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ආධාරයෙන් විවිධ බැංකු වෙත පිවිස බැංකු කටයුතු සිදුකර ගැනීමට පහසුකම් සලසා ඇති බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණික ප්‍රවණතාව .... ලෙස හඳුන්වයි.

35) (අ) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වර්තමානයේ .... නමින් හඳුන්වයි.

(ආ) යූරෝ (EURO) නමින් පොදු මුදල් ඒකකයක් හඳුන්වා දී ඇති ජාත්‍යන්තර වෙළෙඳ කලාපය .... නම් වේ.

36) (අ) සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණය කිරීමේ මානසික හැකියාව කළමනාකරුවකු සතු .... ලෙස හැඳින්වේ.

(ආ) සමස්ත සංවිධානයේ ඉදිරි ගමන්මග තීරණය කරනු ලබන, සමස්ත ආයතනය සඳහාම වගකීම දරණ කළමනාකරණ මට්ටම .... ලෙස හඳුන්වයි.

37) (අ) ආයතනයක තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය .... වන අතර එහිදී .... පිරිවැයත් .... පිරිවැයත් එකිනෙකට සමාන වේ.

(ආ) තොගයේ වටිනාකම හා ගබඩා ඉඩ ප්‍රමාණය යන සාධක පදනම් කරගෙන සිදු කරන තොග පාලන ක්‍රමය .... ලෙස හැඳින්වේ.

38) (අ) කිසියම් විකුණුම්කරුවකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කළඹ .... ලෙස හඳුන්වයි.

(ආ) සන්නමක උච්චාරණය කළ හැකි කොටස....................... ලෙස හැඳින්වෙන අතර නිෂ්පාදකයා විසින් නිෂ්පාදිත වෙළෙඳුන්ට අලෙවි කළ පසුව වෙළෙඳුන් විසින් එම නිෂ්පාදිත සඳහා නිර්මාණය කර ගන්නා සන්නම .... ලෙස හැඳින්වේ.

39) (අ) කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ කොන්දේසි කඩ කරන හෝ නොපිළිපදින සමාගම් ඇතුලත් කරන කඩකල පුවරුව වර්තමානයේ .... නමින් හඳුන්වයි.

(ආ) මූල්‍ය පද්ධතියක් තුළ සිදුවන ප්‍රධාන හා වැදගත්ම කාර්ය වන්නේ .... යි.

40) (අ) යම් නිශ්චිත අරමුණක් ඉටු කිරීම පිණිස සංවිධාන වැඩ ඒකකයක් වශයෙන් කටයුතු, රාජකාරි හා .... සකස් කිරීම .... යි.

(ආ) රැකියා විශ්ලේෂණයෙන් ලබා ගන්නා තොරතුරු .... හා .... සකස් කිරීමට ආධාර කර ගනියි.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41) ව්‍යාපාර සංයෝජන පිළිබඳ නිදසුන් දෙකක් පහත දැක්වේ.

A- මූල්‍ය ආයතන දෙකක් සංයෝජනය වීම

B- බිස්කට් නිෂ්පාදන සමාගමක් ප්‍රවාහන සේවා ආයතනයක් සමග සංයෝජනය වීම.

ඉහත ආයතන දෙක සංයෝජනය වී ඇති ආකාර දෙක නම් කරන්න.

ව්‍යාපාර ආයතනය	**සංයෝජනය වූ ආකාරය**
A	……………………………….
B	……………………………….

42) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන දෙකක් පහත දැක්වේ. එම ආයතන දෙක ලබා දෙන දිරිගැන්වීම් දෙක බැගින් ලියන්න.

ආයතනය	**ලබා දෙන දිරිගැන්වීම**
1. කාර්මික සංවර්ධන මණ්ඩලය	- ………………………………………
	- ………………………………………
2. අපනයන සංවර්ධන මණ්ඩලය	- ………………………………………
	- ………………………………………

43) රක්ෂණ මූලධර්ම සම්බන්ධ පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව එක් එක් ප්‍රකාශය ඉදිරියෙන් සඳහන් කරන්න.

සත්‍ය /අසත්‍ය

A. ජීවිත රක්ෂණයේ දී රක්ෂ්‍ය හිමිකම අදාළ වන්නේ ගිවිසුමට එළඹෙන අවස්ථාවේ පමණි. - ………………………………………

B. ආසන්නම හේතුව මූලධර්මය දේපොළ රක්ෂණයට මෙන්ම ජීවිත රක්ෂණයටද බලපායි. - ………………………………………

C. යම් දේපළක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විට අනුපාතිකව වන්දි ගෙවීම ආදේශන මූලධර්මයයි. - ………………………………………

D. සමුද්‍රීය රක්ෂණයේ දී නැව් බඩු සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම අවශ්‍ය වන්නේ වන්දි ලබා ගන්නා අවස්ථාවේ පමණි. - ………………………………………

44) ආයතන වල ස්වරූපය, නිෂ්පාදිත වල ස්වරූපය අනුව පවතින ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) පද්ධති හතරක් ලියන්න.

………

………

………

………

45) තොග වෙළෙඳාමේ ලක්ෂණ හතරක් ලියන්න.

………

………

………

………

46) සංවිධාන ව්‍යුහයකින් නිරූපණය වන මූලධර්ම හතරක් ලියන්න.

………

………

………

………

47) ව්‍යාපාරයක විවිධ තොග මට්ටම් පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ. මෙම ප්‍රස්තාරයේ i, ii, iii හා iv නිරූපණය වන නම් කරන්න.



i…………………………………………………………………

ii…………………………………………………………………

iii…………………………………………………………………

iv…………………………………………………………………

48) විභව හා පවතින සමජාතිය නිෂ්පාදිත සහ ආදේශකයන් මගින් ඇති කරනු ලබන බලපෑම තරඟකාරිත්වය ලෙස හඳුන්වන අතර තරඟකාරිත්වයේ මට්ටම් හතර වන්නේ,

……

……

……

……

49) මුදල් වෙළෙඳපොළ සමන්විත වන උප වෙළෙඳපොළ හතර නම් කරන්න.

……

……

……

……

50) සෙසු සම්පත් වලට සාපේක්ෂව මානව සම්පතෙහි දැකිය හැකි සුවිශේෂතා හතරක් ලියන්න.

……

……

……

……